**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**10 ශ්‍රේණිය　　　　භූගෝල විද්‍යාව　　　　සැප්තැම්බර් 3 සතිය**

**නිපුණතාව ඃ-** භෞතික හා මානුෂ ක්‍රියාවලින්ගේ අන්තර් ක්‍රියා භෞතික හා මානුෂ පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම ඃ-** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ව්‍යාප්තිය, ලක්ෂණ හා ගැටලු පැහැදිලි කරයි.

**මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් පල ඃ-**

* නිෂ්පාදන කර්මාන්ත අර්ථ දක්වයි.
* නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය ලෝක ආකෘති සිතියමක ලකුණු කරයි.
* නිෂ්පාදන කර්මාන්තවල ලක්ෂණ පැහැදිලි කරයි.
* නිෂ්පාදන කර්මාන්තවල ප්‍රවණතා පැහැදිලි කරයි.
* ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත හා සම්බන්ධ පොදු ගැටළු සාකච්ඡා කරයි.

**පාඩම ඃ-** නිෂ්පාදන කර්මාන්ත - නැව් තැනීමේ කර්මාන්තය

**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් ඃ-**

10 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළ පොතෙහි පිටු අංක 99 සිට 102 තෙක් හොඳින් කියවා ලබා දී ඇති ක්‍රියාකාරකම් කරන්න. පහත දක්වා ඇති උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරකද පරිශීලනය කර වැඩිදුර අධ්‍යයනය කරන්න.

- 18 වන සියවස අගභාගයේදී දේශගවේෂණ කටයුතු, යකඩ හා වානේ නිෂ්පාදන කර්මාන්තයේ දියුණුව යනාදියත් සමඟ යුරෝපා රටවල නැව් තැනීමේ කර්මාන්තය වර්ධනය විය.
- වර්තමාන ලෝකයේ ප්‍රවාහනයට යොමුවන භාණ්ඩ වර්ග අනුව සුවිශේෂී නැව් නිෂ්පාදනයට යොමු වී ඇත.

  උදාඃ- ටැංකි නෞකා　　　　බහාලුම් නෞකා,
  
  තොග භාණ්ඩ ප්‍රවාහන නෞකා　　　　මගී ප්‍රවාහන නෞකා
- මුල් කාලයේදී නැව් නිෂ්පාදනය කෙරෙහි සංවර්ධිත රටවල් යොමු වුවද, වර්තමානය වන විට චීනය, දකුණු කොරියාව, ජපානය වැනි ආසියාතික රටවල්ද නැව් නිෂ්පාදනයට යොමු වීම විශේෂත්වයකි.
- මෑතක සිට එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේද නැව් හා බෝට්ටු නිෂ්පාදනය ආරම්භ වී ඇත.

**ක්‍රියාකාරකම**

01. නැව් තැනීමේ කර්මාන්තයෙහි ඉතිහාසය කෙටියෙන් හඳුන්වන්න.

02. මුල් කාලයේ නැව් තැනීමේ කර්මාන්තය සඳහා සංවර්ධිත රටවල් පමණක් යොමුවීමට හේතු තුනක් ලියන්න.

03. අවශ්‍යතාව අනුව/ ප්‍රවාහනයට යොමුවන භාණ්ඩ වර්ග අනුව ලෝකයේ විවිධ වර්ගයේ නැව් නිෂ්පාදනය කරයි. එවැනි නැව් වර්ග හතරක් ලියන්න.

04. වර්තමානය වනවිට නැව් නිෂ්පාදනයේ ප්‍රමුඛයන් බවට පත්ව ඇති ආසියාතික රටවල් තුනක් නම් කරන්න.

05. නැව් තැනීමේ කර්මාන්තයෙහි දක්නට ඇති ප්‍රවණතා පහක් ලියා දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරක ඃ-**

- මානුෂ භූගෝල විද්‍යාව, දෙවන කොටස (2009), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
- e නැණ පියස - (enenapiyasa.lk)
- හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය - සවියනේ පෙරට යූ ටියුබ් නාලිකාව https://www.saviyenperata.com/